# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2017.03.28

වේලාව : පෙ.ව. 9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | **එම්.ජේ.බී. දයා සෙනරත් මයා.** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී. සෝමසිරි මයා.** | **-** | **ආණ්ඩුකාර ලේකම් (බ.ප)** |
| **3)** | **එම්.එස්.ජේ. තිලකරත්න මයා.** | **-** | **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)** |
| **4)** | **චන්ද්‍රානි සමරකෝන් මිය.** | **-** | **ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)** |
| **5)** | **එස්.ජී.විජයබන්ධු මයා.** | **-** | **ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **එම්.කේ.කේ.ආර්.අබේදීර මිය.** | **-** | **ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප)** |
| **7)** | **එන්.නිල්වල මයා.** | **-** | **ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප)** |
| **8)** | **ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය.** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **9)** | **කේ.කේ.චම්පිකා කනේරු මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)** |
| **10)** | **සිරිසෝම ලොකුවිතාන මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **11)** | **එන්. බන්දුල ප්‍රේමකුමාර මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)** |
| **12)** | **ඩී.එම්.එන්.දිසානායක මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)** |
| **13)** | **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)** |
| **14)** | **කණිෂ්ක ශ්‍රීලාල් මයා.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **15)** | **කේ.එන්.සූරියආරච්චි මිය.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රය වෙත බස්නාහිර පළාත් සභා කාර්යාල ගෙන යාමේ දී මිල දී ගත යුතු භාණ්ඩ වල ඇස්තමේන්තුව, ඉතිරි වන භාණ්ඩ සඳහා කටයුතු කළ යුතු ක්‍රමවේදය, වාහන නැවැත්වීම, නව කාර්යාල එම පරිශ්‍රයේ ස්ථාපිත කළ යුතු ක්‍රමවේදය ආදී කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් අද දින (2017.03.28) පැවැත්වීමට නියමිත බවත්, එහි දී මේ සම්බන්ධව පුළුල් ව සාකච්ඡා කර තීරණයක් ගත හැකි බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 02. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | පළාත් සභා නිලධාරීන් වෙනුවෙන් ඉදි වන නිල නිවාස සංකීර්ණය සඳහා හෝමාගම, ගබඩාවත්ත ප්‍රදේශයේ ඉඩමට අදාළ නිවාස සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම හා එය ඊළඟ ලේකම්වරුන්ගේ රැස්වීම සඳහා ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 03. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | අතිගරු ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සියල්ල නිරීක්ෂණය කර, එහි දී ගන්නා ලද ඡායාරූප සහ විස්තර ඇතුළත් ප්‍රගතිය, ගරු ආණ්ඩුකාරතුමා හා ප්‍රධාන ලේකම් වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීම.<br>පළාත් සභාව මඟින් සංවර්ධන, ඉදිකිරීම් ආදී විශේෂ වැඩසටහන් සිදු කිරීමේ දී ඒ සඳහා පළාත් සභාවේ නාමය ඉස්මතු වන පරිදි මාධ්‍යය හරහා ප්‍රචාරණයක් ලබා දීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04. | භාෂා ප්‍රතිපත්තිය, තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවි යාවත්කාලීන කිරීම. | ප්‍රධාන ලේකම් විසින්, පළාත් සභාවේ සියලු ම අමාත්‍යාංශ / ආයතන වල වෙබ් අඩවි අවසන් නිරීක්ෂණය සඳහා 2017.04.28 දින යොදා ගන්නා ලදි.<br>ITRDI ආයතනය සමඟ සම්බන්ධ වී තම අමාත්‍යාංශ සහ ආයතන වල වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය කර ගැනීමට දින ලබා දුන් නමුත්, ඒ සඳහා නොපැමිණි ආයතන සඳහා වෙනත් දිනයන් ලබා දීමටත්, ඒ සඳහා පැමිණි ආයතන වල වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩි දියුණු කිරීම. | නව පරිශ්‍රය සැලසුම් කිරීමේ දී, තාක්ෂණය උපරිම අන්දමින් භාවිතා කරමින් සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීමට මූලික සැලසුමක් සකසා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම.<br>ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ ඒකකය හරහා උක්ත සැලසුම ක්‍රියාත්මක කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 06. | 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය කරනු ලබන දිළිඳුකමින් නිදහස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය, කඩිනමින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඡායාරූප මඟින් ඉදිරිපත් කිරීම.<br>මේ සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), අධ්‍යක්ෂ-සැලසුම්, ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡාවක් 2017.03.29 දින යොදා ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 07. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම සඳහා තම ආයතනයන්හි ගෙවීම් සිදු කරන ආකාරය දන්වා එවන ලෙස සියලුම ආයතන දැනුවත් කළ ද, තවමත් පිළිතුරු නොලත් බැවින්, අදාළ ආයතන වලින් පිළිතුරු ලබා දෙන ලෙස දැනුම් දීම.<br><br>සමාජ සේවා/ග්‍රාම සංවර්ධන නිලධාරීන් යතුරුපැදි සහ දින වැටුප් ගන්නේ ද, එසේ ලබා ගන්නේ කුමන පදනමකින් ද යන්න, සෞඛ්‍ය හා ප්‍රවාහන අමාත්‍යාංශ වෙතින් විමසා ඇති නමුත් තවමත් පිළිතුරු නොලත් බැවින්, සේවක දිනය වෙනුවෙන් ඉදිරිපත් කිරීම සඳහා කඩිනමින් පිළිතුරු යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 08. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොලොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | මේ සම්බන්ධයෙන් කරන ලද විමර්ශන වාර්තාව ප්‍රවාහන හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බැවින්, වගකිවයුත්තන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර, එහි ප්‍රගතිය ගිණුම් කාරක සභාව වෙත වාර්තා කිරීම. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 09. | ඔලියමුල්ල මහා විද්‍යාලයේ ඉදිකිරීම සම්බන්ධව. | ඔලියමුල්ල මහා විද්‍යාලය ඉදිකිරීම හා සම්බන්ධව උද්ගත වී ඇති ගැටලුව සඳහා මැදිහත් වී සිටින ස්වාමීන්වහන්සේ සමඟ සාකච්ඡාවක් පවත්වා, එහි ප්‍රගතිය ඊළඟ ලේකම්වරුන්ගේ රැස්වීමේ දී ඉදිරිපත් කිරීම. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 10. | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදිකිරීම. | ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය ගැනීම පිණිස ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීමට සකස් කර ඇති වාර්තාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ඉදිරිපත් කළ අතර, එය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11. | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවන ආයතනයට අදාළ ගැටලුව පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී ඇති තීරණය අනුව, එහි ඉදිකිරීම් සඳහා බාධාවක් නොවන බැවින්, ඉදිරි කටයුතු සිදු කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 12. | අභ්‍යන්තර විගණන නිලධාරීන් අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත රැස්වීමේ දී සාකච්ඡා කිරීමට තීරණය විය. | සියලුම ලේකම්වරුන් |
| 13. | රාජ්‍ය ආයතන වල සේවක දිනයක් ප්‍රකාශයට පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම - 2017 | 2017.03.31 දින ප්‍රධාන ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිත "සේවක දිනය" පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් සියලු ලේකම්වරුන් දැනුවත් කළ අතර, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු මැති ඇමතිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ප්‍රධාන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් හට ආරාධනා කිරීමට කටයුතු කිරීම හා උත්සවය සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 14. | බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අය විය යුතු හිඟ ආදායම් ප්‍රමාණය අය කර ගැනීම. | බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට වාහන ආදායම් බලපත්‍ර මඟින් අය විය යුතු හිඟ ආදායම් ප්‍රමාණය අය කර ගැනීම පිළිබඳ ව තවමත් ගැටලු පවතින බැවින්, සාකච්ඡාවක් සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 15. | ක්‍රීඩා සතියට සමගාමී ව සිදු කළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය වාර්තා කිරීම. | ක්‍රීඩා සතියට අදාළ ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වල ඡායාරූප හා වීඩියෝ සතියක් ඇතුළත ප්‍රධාන ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කිරීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ ආයතන ප්‍රධානීන්. |
| 16. | දරුවන් සුරකිමු ජාතික වැඩසටහන 2017-2019 | "දරුවන් සුරකිමු" 2017 – 2019 ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා ඍජුව දායකත්වය සපයන, අමාත්‍යාංශ යටතේ ඇති අනෙකුත් ආයතන වලින් 2017 වාර්ෂික සැලැස්ම ලබා ගැනීමට කටයුතු කිරීම.<br><br>උක්ත වැඩසටහන අධීක්ෂණය කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 17. | වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම 2016 – 2018 | "වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම 2016 – 2018" වැඩසටහනට සමගාමීව පළාත තුල සිටින වකුගඩු රෝගීන් හඳුනා ගැනීම හා රෝග ව්‍යාප්තිය වැළැක්වීමේ අරමුණින් වන දල සැලැස්ම, කාල රාමු ද සමඟ අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක සැලැස්ම සකසා යොමු කිරීම.<br>ඉදිරියේ දී වැඩමුළුවක් සංවිධානය කර බස්නාහිර පළාතට පොදු සැලැස්මක් සැකසීම කෙරෙහි අවධානය යොමු විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 18. | 2016 වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් සංවර්ධන යෝජනා වල ප්‍රගතිය | 2016 වර්ෂයේ දී අවසන් කිරීමට සැලසුම් කරන ලද නමුත්, ඉටු කිරීමට නොහැකි වූ සැලසුම් පිළිබඳ මේ වන විට අධීක්ෂණය සිදු කරමින් පවතින බැවින්, ඒ සඳහා හේතු සෙවීමට ක්‍රමවේදයක් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 19. | බස්නාහිර පළාතේ පාසල් ආශ්‍රිතව ඩෙංගු ව්‍යාප්තිය මර්දනය කිරීම. | 2017 මැයි මස 17 දින බඳවා ගැනීමට නියමිත උපාධිධාරී අභ්‍යාසලාභීන් 225න්, එක් නිලධාරියෙකු මඟින් පාසල් 5ක් ආවරණය වන පරිදි කලාප කාර්යාල සඳහා අනුයුක්ත කරලීමටත්, ඔවුන් විධිමත් සැලැස්මක් අනුව පාසල් ආශ්‍රිතව ඩෙංගු මර්දන වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා යෙදවීමටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 20. | මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික ව්‍යාපාරය 2017 | ඉදිරියේ දී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා එක් ව වැඩමුළුවක් සංවිධානය කර බස්නාහිර පළාතට පොදු සැලැස්මක් සැකසීම කෙරෙහි අවධානය යොමු විය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | වාහන මිල දී ගැනීම් | මේ වන විට අනුමැතිය ලැබී ඇති වාහන මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ගැනීමට ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.<br><br>භාවිතා කළ වාහන වෙනුවට නව වාහන ලැබී ඇති අවස්ථාවලදී භාවිතා කළ වාහන සඳහා ගන්නා පියවර දන්වා එවීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | 33 වන ප්‍රධාන අමාත්‍ය සමුළුව සඳහා යෝජනා | ප්‍රධාන අමාත්‍ය සමුළුව සඳහා ඉදිරිපත් කිරීම වෙනුවෙන් අමාත්‍යාංශය මට්ටමින් යෝජනා පසුබිම් වාර්තා ද සමඟ යොමු කිරීම. | සියලුම ලේකම්වරු |